**අක්කරෙයිපත්තු මහ නගර සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්රේල් 10 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමණාකරණ වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට අක්කරෙයිපත්තු මහ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ආයතනයේ ස්ථාවර වත්කම් වර්ගීකරණය අනුව ඉඩම් ගොඩනැගිලි සහ මංමාවත් වෙන්වෙන් වශයෙන් පෙන්වා තිබුණද, ඉඩම් ගොඩනැගිලි ශේෂයතුල මාර්ග පිරිවැය රු. 310,828 ක් ඇතුලත්ව් තිබුණු අතර, රු.526,054 ක්වූ ගොඩනැගිලි අළුත්වැඩියා වියදම් ප්‍රාග්ධන වැයක් ලෙස සලකා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි. | අදාල වියදම් අදාල ගිණුම් යටතේ පෙන්විය යුතු වේ. | උක්ත ඉඩම් ගොඩනැගිලි ශේෂයතුල වැරදීමකින් මාර්ග පිරිවැයද ඇතුලත්වී තිබුණි. මෙය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කර ඇති බව දන්වා සිටිමි. ගොඩනැගිලි අළුත්වැඩියා වියදම් ගොඩනැගිල්ලේ පොලව මත තට්ටුවක් දැම්ම නිසා එය අළුත් එකතුවීමක් ලෙස සලකා ප්‍රාග්ධන වැයක් ලෙස සලකනලදි. මෙය වැරද්දක් නම් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ii) | මහ නගර සභා සතුව තිබෙන වාහන 61 කින් වාහන 18 ක වටිනාකම තක්සේරුකර ගිණුම්වල දක්වා නොතිබුණි. | තක්සේරු කර අදාල ගිණුම් යටතේ දැක්විය යුතු වේ. | මහ නගර සභාවේ තිබෙන වාහන 61 කින් වාහන 18 ක වටිනාකම් තක්සේරු කිරීම සඳහා කමිටුවක් පත්කර ඉහත වාහනවල වටිනාකම තක්සේරුකර 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | සමාලෝචිත වර්ෂයේ අබලි භාණ්ඩ අයිතම් 372 ක් විකිණීමෙන් ලද මුදල රු. 80,650 ක් ලෙස දක්වා තිබුණද, එම වත්කම්වල පිරිවැය ගිණුම්වලින් ඉවත්කර නොතිබුණි. | අදාල ලේඛනවලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාල භාණ්ඩ විකිණීමෙන් මුදල් ලබාගෙන තිබුණද, වත්කම් සඳහා ක්ෂය වෙන් කිරීම් සහ ප්‍රාග්ධන ආදායම් ගිණුම්ගතකරණ සම්බන්ධයෙන් පැහැදිලිතාවය කර සහ කපාහැරීම සඳහා අනුමැතිය ලබා ගැනීම යන කාර්යයන් ඉටු කළ අතර කපා හැරීම සිදුකර නොතිබුණි. නමුත් නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (iv) | හඳුනා ගැනීමකින් තොරව හිඟ ආදායම් ලෙස වසර තුනකට වඩා වැඩි කාලයක සිට මූල්‍ය ප්‍රකාශන වල අඛණ්ඩව දක්වා තිබූ රු. 12,200 ක මුදල සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| (v) | 2018 දෙසැම්බර් 31 දිනට සභාවේ ආයුර්වේද බෙහෙත් ශාලාවේ බෙහෙත් වර්ග 18 ක තොගයක් තිබුණද, එය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | වටිනාකම ගිණුම්වලට ඇතුලත් කළ යුතු වේ. | ආයුර්වේද බෙහෙත් ශාලාවට අවශ්‍ය බෙහෙත් වර්ග ලබාගැනීම සඳහා අවශ්‍ය මුදල් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබෙන බැවින්, ඒ සඳහා සභා අරමුදල් යොදවනු නොලැබේ. තවද, බෙහෙත් වර්ග පාරිභෝගික භාණ්ඩ වර්ග ලෙස සලකන බැවින් අවසන් ගිණුම්වල හිඟයක් ලෙස නොපෙන්වා ඉතිරි භාණ්ඩ තොග වාර්තාව සකස්කර පළාත් සහ ආයුර්වේද දෙපාර්තමේන්තුවට පාලන දෙපාර්තමේන්තුවට යවන බව දන්වා සිටිමි. |

**1.4** **අනුකූල නොවීම**

**------------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

**---------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | ------------------------ | ------------------ | ------------ | ------------------------ |
| (අ) | මහනගර සහ ආඥා පනත 218 වගන්තිය | එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් කොමසාරිස් විසින් පරිපාලනය පිළිබඳ පිළියෙල කළයුතු විස්තරාත්මක වාර්තාව 2018 වර්ෂය වෙනුවෙන් පිළියෙලකර නොතිබුණි. | පිළියෙල කිරීමට කටයුතු කළයුතුවේ. | 2018 වර්ෂයේ පරිපාලන වාර්තාව පිළියෙල කිරීම් සිදුවන අතර එය නිමවූ විගස වාර්තාව ලබා දීමට සලස්වන බව දන්වා සිටිමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් | වසර දෙකක් ඉක්මවූ රු. 105,000 ක් වටිනා ටෙන්ඩර් තැන්පත් සඳහා මුදල් රෙගුලාසි අනුව ගෙවා නිරවුල් කිරීමට | කල් ඉකුත්වූ තැන්පත්, මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු | අදාල මුදලින් වර්ෂ දෙකක් ඉක්මවූ ටෙන්ඩර් තැන්පතු ආදායමට ගැනිමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

| | | | | |
|---|---|---|---|---|
| | රෙගුලාසි 571 | හෝ ආදායමට මාරු කිරිමට කටයුතු කර නොතිබුණි. | කළයුතුවේ. | |
| (ඇ) | මොටර් රථ ප්‍රවාහන පනතේ 203 වන වගන්තිය | සියළුම වාහන සඳහා වාර්ෂිකව ආදායම් බලපත්‍ර ලබාගතයුතු වුවද, සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා වාහන 12 ක් සඳහා සමාලෝචිත වර්ෂයට අදාලව ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | ආදායම් බලපත්‍ර ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. | වාහන අළුත්වැඩියා කර දුම් පරීක්ෂණ වාර්තාවද ලබාගෙන ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.15,321,575 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.20,232,252 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 10,100 | 19,083 | 7,463 | 36,870 | 10,100 | 10,095 | 5,533 | 25,249 |
| කුලී | 16,558 | 13,021 | 12,887 | 11,434 | 15,194 | 14,314 | 12,139 | 15,720 |
| බලපත්‍ර ගාස්තු | 2,650 | 2,183 | 2,267 | - | 2,650 | 1,751 | 1,751 | - |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දින දක්වා සභාව විසින් අයකළයුතු ආදායම් රු. 157,258,888 කින් සමාලෝචිත වර්ෂයේදී රු. 94,306,976 ක් අයකර ගෙන තිබුණි. මේ අනුව ආදායම් රැස්කිරීමට ප්‍රගතිය සියයට 60% ක් විය. | ඉකුත් වර්ෂයේ හිඟ මුදල සමඟ සමාලෝචිත වර්ෂයේ ආදායම් ද අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අනාගතයේදී සියළුම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. හිඟ කඩකුලි අයකර ගැනීමට නීතියානුකූලව කටයුතු කරන අතර එහි තීරණ අනුව, හිඟ මුදල අයකරගත හැකි වේයයි බලාපොරොත්තු වේවි. |

**2.3.3 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශයේ වෙසෙන 12,873 පදිංචිකරුවන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා අයවිය යුතු මුළු එකතුව රු. 44,332,364 ක වරිපනම් බදු වලින් සියයට 17 ක් වන රු. 7,462,795 ක් වරිපනම් බදු පමණක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර තිබුණි. | වරිපනම් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි. |

**2.3.4 කුලී**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 1992 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාල බදුකුලි රු. 16,178,257 කින් සියයට 46 ක් වන රු. 7,503,388 ක් පමණක් අයවී තිබුණි. | ඉකුත් වර්ෂයේ හිඟය සමඟ සමාලෝචිත වර්ෂයේ බදු කුලි ආදායම්ද අයකිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයවිය යුතු හිඟ කඩකාමර කුලි රු. 11,767,402 ක මුළු මුදලින් සියයට 15 ක් වන රු. 1,815,600 ක්වූ හිඟ මුදල පමණක් අයවී තිබුණි. | ගිවිසුමේ කොන්දේසි අනුව කුලි මුදල අදාල කාලය තුල නොගෙවීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වර්ෂ අටකට පෙර සභාවේ සේවකයෙකුට සහ ප්‍රජා මධ්‍යස්ථානයට ලබාදී තිබූ රු. 106,003 ක අත්තිකාරම් මුදල් දෙක අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | මහ නගර සභාවට අයත් ධාවන තත්වයේ තිබෙන මොටර් වාහන 31 කින් මොටර් වාහන 07 ක් හැර අනෙකුත් මොටර් වාහන 26 ක් සම්බන්ධයෙන් වාර්ෂිකව පැවැත්විය යුතු ඉන්ධන දහන පරික්ෂාව සිදුකර නොතිබුණි. | ඉන්ධන දහන පරික්ෂාව සිදු කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉතිරි මොටර් වාහන 26 ක් සඳහා ඉන්ධන දහන පරික්ෂාව සිදු කිරීමට වහාම කටයුතු කරනු ලැබේ. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යා සැලසුම අනුව තනතුරු පුරප්පාඩු 44 ක් පුරවා නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව සහ පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. |
| (ආ) | සභාව විසින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහායක කෙනෙකුගේ සේවය ලබාගත් නමුදු මෙම තනතුර සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | අනාගතයේදි මෙය නිවැරදි කර ගැනිමට කටයුතු කරමි. |
| (ඇ) | 2012 සහ 2013 වර්ෂවල ධූරය අත්හැර ගිය නිලධාරින් 04 දෙනෙකුගෙන් අයවියයුතු රු. 64,598 ක ණය ශේෂය අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ධූරය අත්හැර ගිය නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතාවය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ පවත්වාගනු ලබන මුදල් පොත අනුව පොදු බැංකු ජංගම ගිණුමේ 2018 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මාස දක්වා සෑම මාසයකම අවසානයේදි රුපියල් මිලියන 16.3 සිට රුපියල් මිලියන 20.8 දක්වා පරාසය තුල මුදල් ශේෂ දක්නට ලදි. මෙම මුදල් ආදායම් ඉපයීමේ ආයෝජන වල ආයෝජනය කිරිමට සභාව කටයුතු නොකිරීමෙන් රු. 1,500,000 ක් පමණ ආදායමක් අහිමි වී තිබුණි. | වැඩිපුර මුදල් ආදායම් ඉපයීමේ කෙටි කාලින තැන්පත්වල තැන්පත්කර ආදායම් වැඩිකර ගත යුතු වේ. | මුදල් පොතේ ශේෂය, වැටුප් ප්‍රතිපූර්ණය, ටෙන්ඩර් තැන්පත් ඇතුලත්වී තිබිම, පුනරාවර්තන වියදම් සඳහා ද්‍රවශීලිභාවය පවත්වාගෙන යාම සඳහා මෙම මුදල් ශේෂය පවත්වා තිබුණි. |
| (ආ) | මහ නගර සභාවේ 100470225924 අංක දරන රු. 37,959 ක් වටිනා ඉතිරි කිරීම් තැන්පත් ගිණුම 2017 දෙසැම්බර් සිට වාර්තා දිනය දක්වා ක්‍රියාත්මක වී නොතිබුණි. | ආපසු ලබා ගැනීමට තීරණය කර ආපසු ලබා ගත යුතු වේ. | මෙම ගිණුම් කල්මුනේ ජාතික ඉතිරි කිරීම් බැංකුවේ පසුගිය කාලවල තැන්පත් කරන ලද මෙම ගිණුමේ ශේෂය ආපසු ලබා ගැනීමට කටයුතු කරනු ඇත. |
| (ඇ) | 2013 වර්ෂයේ සභා තීරණ අනුව වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තයෙන් නිශ්චිත සංවර්ධන වැඩ ඉටු කිරීම සඳහා වෙන්කර තිබූ රු. 15,000,000 ක ප්‍රතිපාදනය 2018 වර්ෂය දක්වා අදාල සංවර්ධන කාර්යයන් සඳහා යොදවා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදලට එකතුකර තිබුණි. | මුදල් ප්‍රතිපාදනය අදාල අරමුණු සඳහා යොදවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | රේඛිය අමාත්‍යාංශයේ අරමුදල් සහ වෙනත් යොජනා ක්‍රමවල අරමුදල් යොදවා ගත් බැවින් සභාවේ මෙම ප්‍රතිපාදනය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. එම නිසා මෙම මුදල සමුච්චිත අරමුදලට මාරුකරන ලදි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ වෙළඳ ආයතන 635 කින් වෙළඳ අයතන 250 ක් පමණක් වෙළඳ බලපත්‍ර ලබා ගෙන තිබුණු අතර රු. 2,183,100 ක් අයවී තිබුණි. වෙළඳ ආයතන 385 ක් සභාවේ බලපත්‍රයක් නොමැතිව වෙළඳාම් කටයුතුවල යෙදී ඇත. | ව්‍යාපාර ස්ථාන සඳහා බලපත්‍ර ලබා දීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

### 3.4 වත්කම් කළමනාකරණය

#### 3.4.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් පොත්වල දක්වා තිබූ රුපියල් මිලියන 5.3 ක් වටිනා වාහන 06 ක් සහ වටිනාකම තක්සේරු නොකළ තවත් වාහන 05 ක අයිතිය මහ නගර සභාවේ නමට මාරුකර ගැනීමට අවශ්‍ය කටයුතු විගණන දිනය වන 2019 මැයි මස 30 දින වන විටත් අවසන් කර නොතිබුණි. | අයිතිය මහ නගර සභාවේ නමට මාරු කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන පළාත් සභා අමාත්‍යාංශයෙන් ලැබුණු සියළුම වාහන වල අයිතිය මාරු කර දෙන ලෙස ඉල්ලුම්කර තිබුණද, වාහන කීපයක් අයිතිය පවරාදී නොතිබුණි. අදාල අයදුම්පත්වල පිටපත් අමුණා නැවත යවන ලදී. |

#### 3.4.2 නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2014 වර්ෂයේදී ගිනි නිවන අංශයක් ආරම්භ කිරිම සඳහා රු. 19,882,270 ක් වැයකර ඉදිකරන ලද ගොඩනැගිල්ලක ඉදිකරිමේ කටයුතු නිමනොකර වර්ෂ 05 ක් අත්හැරදමා තිබුණි. | වැඩ ආරම්භ කිරිමට කටයුතු කළ යුතු වේ. | අදාල අමාත්‍යාංශ විසින් මෙම ගොඩනැගිල්ලේ කටයුතු නැවත ආරම්භ කර ඇති බව දන්වන අතර මෙයට අදාල ලිපිගොනු කිසිවක් අප කාර්යාලයේ නොමැති බව දන්වා සිටිමි. |
| (ආ) ඝණ අපද්‍රව්‍යාවලින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීම සඳහා 2018 වර්ෂයේදී රු. 999,500 ක් වැයකර මිලදිගෙන සවිකර තිබූ යන්ත්‍රය විගණන දිනය වන 2019 මැයි 30 දක්වා සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | මෙය ආරම්භ කිරිමට කටයුතු කළ යුතු වේ. | මේ මාසයේ සිට නැවත ආරම්භ කරන බව දැනුම් දෙමි. |

#### 3.4.3 වත්කම්වලින් ලැබියයුතු ආදායම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් කඩ කාමර සහ කාමර 107 ක් ආදායම් ඉපැයීම් සඳහා යොදවා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිෂ්කාර්යව තිබුණි. තවද, විගණන දිනය වන 2019 මැයි 30 දිනට කඩකාමර 105 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | නිෂ්කාර්යව වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | මාළු වෙළඳ පොළෙහි කඩ කාමර සඳහා මිල ගණන් කැඳවා තිබුණද, එම කාලපරිච්ඡේදයේ අයදුම්පත් කිසිවක් ලැබී නොතිබුණි. ටෙන්ඩර් කැඳවීමට කටයුතු කරන බව දන්වමි. |

### 3.4.4 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහ නගර සභාවේ වතුර බවුසර් ටේලර් දෙකක්, වේන් එකේ එක්සවේටරයක්, යතුරපැදි 03 ක්, ට්‍රැක්ටර් 03 ක් සහ ලොරියක් වශයෙන් වාහන 10 ක් අළුත්වැඩියා කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ ප්‍රයෝජනයට නොගෙන තිබුණද, එම වාහන අළුත්වැඩියා කර ප්‍රයොජනයට ගැනීමට හෝ වෙන්දේසියේ විකිණීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අළුත්වැඩියා කිරිමට නොහැකි ඒවා වෙන්දේසි කිරිමට කටයුතු කළ යුතු වේ. | නිෂ්කාර්යව තිබෙන වතුර බවුසර් ටේලරෙ 02, වේන් එක්සවේටර් යන්ත්‍ර 01 සහ යතුරුපැදි 03ක්, ට්‍රැක්ටර් 03 ක්, ටිපර් වර්ගයේ ලොරි 01 යන වාහන හඳුනාගෙන අළුත්වැඩියා කිරීමට හෝ තක්සේරු කිරිමට කමිටුවක් පත්කර ඇති අතර කමිටු වාර්තාව ලැබුණු පසු අළුත්වැඩියා කිරිමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කරන බව දැනුම් දෙමි. |